Sponsored by
Kandy Food & Spices,
Hampton Park

# ෂෙහාන් අබේපිටිය

ආසියානු කලාපීය රට වලින් කඟවේනුන් මෙන් හඹා යන කෙටි ධාවන ශූරයන් පහළවන්නේ ඉතාමත්ම කලාතුරකිනි. ලොව හරි අඩකටත් වඩා ජනගහනයක් ඇති ඉන්දියාව සහ චීනය පමණක් නොව තාක්‍ෂණයෙන් පරපෝෂිත ජපානයෙන් පවා ඇසූ කාලයක මෙවැනි ධාවන ශූරයෙකු පහළ වූ වගක් මතකයේ නැත. කෙසේ වෙතත් ඉඳහිට හෝ එවැනි දරුඵල ලැබීමට තරම් ලක්මව වාසනාවන්තියකි. මීට පෙර එසේ පහළ වූ ධාවන ශූරිය ලොව අනෙකුත් ශූරියන් පරදා හෝ හරි හරියට දුවමින් කාලයක් තිස්සේ හපන්කම් පා වසර මුල් භාගයේදී විශ්‍රාම ගියේය. ඈ සුසන්තිකා ජයසිංහයි. මෙවර අසන්නට ලැබුණේ ධාවන ශූරයෙකු ගැනයි. ඔහු ෂෙහාන් අබේපිටිය නම් යොවුන් පාසැල් වියේ තරුණයෙකි. පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙලේදී මීටර් 100, 200 සහ 100×4 යන ඉසව් තුනේම

**ලොව හරි අඩකටත් වඩා ජනගහනයක් ඇති ඉන්දියාව සහ චීනය පමණක් නොව තාක්‍ෂණයෙන් පරපෝෂිත ජපානයෙන් පවා ඇසූ කාලයක මෙවැනි ධාවන ශූරයෙකු පහළ වූ වගක් මතකයේ නැත. කෙසේ වෙතත් ඉඳහිට හෝ එවැනි දරුඵල ලැබීමට තරම් ලක්මව වාසනාවන්තියකි.**

රන් පදක්කම් දිනා ගැනීමට සමත් වූ මේ තරුණයා මීටර් 100 ඉසව්ව තත්පර 10.43 ක දී නිම කර වාර්තාවක් ද තබා ඇත. තවමත් පාසැල් වියේ පසු වන ෂෙහාන් තමා ඉදිරිපත් වූ ජාත්‍යන්තර තරග කිහිපයකින්ම ජයග්‍රහණ ලබා ගෙන ඉතා දිගු ගමනක පෙර නිමිති පෙන්නුම් කර තිබේ.




## කෙටි දුර ධාවන ශූරයා පෙරටම

ශ්‍රී ලංකාවේ දක්‍ෂ පුහුණුකරුවෙකු වන සුනිල් පෙරේරා මහතා යටතේ පුහුණුව ලබන ඔහුට ශ්‍රී ලංකාව වෙනුවෙන් දිගු ගමනක් යන්නට ශක්තිය, ධෛර්යය සහ වාසනාව ලැබේවා යි අපි ප්‍රාර්ථනා කරමු.

# අජන්ත මෙන්ඩිස්ට ඩුබායි රාජ්‍යයෙන් සුඛෝපභෝගී නිවසක් තෑගි!!

පසුගියදා කැනඩාවේ පැවැති 20:20 තරගාවලිය ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා කණ්ඩායමට හැකි විය. අවසානන මහා තරගය පකිස්ථානයට එරෙහිව තරග වැදී ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා කණ්ඩායමේ අජන්ත මෙන්ඩිස් නැවත වරක් උසස් දස්කම් පාමින් තරගාවලියේ වීරයාට හිමි සම්මානය දිනා ගැනීම විශේෂ සිදුවීමකි. ලකුණු 55 ක දී කඩුලු 11 ක් ලබා ගනිමින් ඔහු ලැබූ සම්මානය වෙනුවෙන් ඩුබායි රාජ්‍යයෙන් කෝටි 9 ක් වටිනා සුඛෝපභෝගී නිවසක් හිමි වීම ද සුවිශේෂ සිදුවීමකි.

# මාතෘ භූමි

## අමරණීය සෙන්පතිය,

දින සති මාස ගණන් වලට පෙරළෙමින් පසුගිය දා දූයට අහිමි වූ මේජර් ජනරාල් ජානක පෙරේරා මහතාගේ දේහය මේ වන විට පොළොවට දිරා පත් වන්නට පටන් ගෙන ඇතැයි සිතිය හැකිය. එහෙත් ඔහුගේ නාමය යුග ගණනක් ඉදිරියට නොනැසී පැත යාම වළක්වන්නට ඝාතකයනට නියත වශයෙන්ම හැකියාවක් නොමැත. ඔහුගේ ඝාතනයෙන් පසුව සුපුරුදු පරිදි පුවත් පත් පිටු දහස් ගණනින් ලියවුණ දෑ ඔබත් කියවන්නට ඇතැයි සිතමි. එහෙත් එතුමාගේ ඝාතනයත් සමග ඉතා ප්‍රබලව කැපී පෙනෙන ශ්‍රී ලාංකික දේශපාලන බෙදවාචකය තේරුම් ගන්නට හෝ ඒ ගැන ලියන්නට ඉඩක් ශ්‍රී ලාංකික අපට අහිමි වන යුගයක අපි පසු වෙමු. ප්‍රජාතාන්ත්‍රික ජන රජයක තමන් කැමති දේශපාලන පක්ෂයක් තෝරා ගැනීම පවා අහිමි වූ කාල පරිච්ඡේදයකට අපි පා තබා ඇත්තෙමු. විපක්ෂ දේශපාලනය තෝරා ගැනීම නිසා ආරක්ෂාව ඉවත් කර ඔහුට ජීවිත තර්ජනයක් නැතැයි පැවසීමට තරම් පහත් තත්වයකට වැටුණු රාජ්‍ය පාලනයක පුරවැසියකු වීම කොයි තරම් අභාග්‍යයක් ද?



ඔහු ශ්‍රී ලංකා යුද හමුදාවේ සිටි අති දක්ෂ මෙන්ම විනය ගරුක සෙන්පතියෙකි. ඕනෑම අභියෝගයක් බාර ගැනීමට ඇති කැමැත්ත ඔහුගේ ජීවානුගත පුරුද්දක් විය. ඔහුට උතුරු නැගෙ නහිර සංග්‍රාමය පිළිබඳව මනා වැටහීමක් මෙන්ම එහි විනාශකාරී බව පිළිබඳ හොඳ අවබෝධයක් ද තිබුණි. කැඩෙට් නිලධාරියකු ලෙස හමුදා සේවය බැඳුණු ඔහු බ්‍රිගේඩියර් ජනරාල් පදවිය දක්වා යන ගමනේ දී බෙදුම් වාදීන්ට එරෙහිව මෙහෙයුම් ගණනාවක්ම ජයග්‍රහණය කළේ ය. හමුදා සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසුව ඔස්ට්‍රේලියාවේ හා ඉන්දුනීසියාවේ මහකොමසාරිස් ලෙස ඉතා අවංක සේවයක් ද ඉටු කළේ ය. ඉතාම සංවිධානාත්මකව සිය කටයුතු මෙහෙයවන ඔහු අවසන් කාලයේ උතුරු මැද පළාත් සභාවේ විපක්ෂ නායක ලෙස කටයුතු කරන විට ද කැපී පෙනුණේ විනය ගරුක බව හා අවංක බවයි.

ඔහු සටන් බිමේදී දක්ෂ අණ දෙන්නෙකි. දක්ෂ සටන් සැළසුම්කරුවෙකි. රාජ්‍ය සේවයේදී අවංකා රාජ්‍ය නිලධාරියෙකු වූ ජානක සාමාන්‍ය ජීවිතයේ දී මිත්‍රශීලී නිහතමානී පුද්ගලයෙකි.

ඔහු සිය ජීවිත කාලයම කැප කළේ ශ්‍රී ලංකාවේ ඒකීය භාවය හා ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමටත් දූෂණයෙන් හා භීෂණයෙන් මුදවාගත් රටක නීතිගරුක භාවය ගොඩ නැගීමටත් ය. අවාසනාවකට මෙන් එවන් පුදගලයනට ආරක්ෂාව පසයන රාජ්‍යයක් අපේ මව් බිමේ නැත.

වැලි ඔය සටන ජයග්‍රහණය කළේ ඔහුගේ සැළසුම් සහගත සටන් මෙහෙයවීම නිසා ය. යාපනය අතහැර තිස් දහසක් පමණ වූ හමුදාව ඉවත් කර ගැනීමට ඉන්දියාවෙන් ආධාර පතමින් සිටි පාලකයන්ට පිහිටට සිටි එකම හමුදා නිලධාරියා ඔහු ය. ඔහු එම අභියෝගය බාර ගෙන යාපනයෙන් කොටි පලවාහැර මුදා ගත්තද එවකට සිටි පාලකයන් එය අගැයීමට ලක් කළේ නැත. එපමණක් නොව තමන්ට හිමිවන්නට තිබූ හමුදාපති තනතුරත් නොදීමට තරම් අකාරුනික වූ පාලකයනට පවා ඔහු අවංකව සේවය කළේ ය.

ආරක්ෂාව පිළිබඳව හොඳ වැටහීමක් තිබූ ඔහු තමන්ට ඇති මරණ තර්ජන නිසා ආරක්සාව ලබා දෙන ලෙස ඉල්ලා නීතියේ පිහිට පවා පැතුවේ ය. රට නිවාශ කළ ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනය කළ සිංහල දේශප්‍රේමී ලේබලය අලවා ගත් ඊනියා බංකොලොත් දේශපාලකයන්ට පවා ආරක්ෂාව ලබා දෙන්නට රජය පැකිළෙන්නේ නැත. බෞද්ධ භික්ෂූන් ඝාතනය කළ දහස් ගණන් සොල්දාදුවන් මරා දමූවන්ට පවා පාරවල් වසා දමා ආරක්ෂාව ලබා දීමට අපේ පාලකයන් පැකිලෙන්නේ නැත. ආරක්ෂාව නොලැබෙන්නේ ජානක පෙරේරා වැනි වටිනා ලක් දරුවන්ට ය. නොලැබෙන ආරක්ෂාව ඉල්ලා ඔහු කෑ ගසන විට ඊනියා දේශ ප්‍රේමී සංවිධාන පවා මුනිවත රැකීමට වග බලා ගැනීම කොයි තරම් අභාග්‍යයක් ද?

මරණයෙන් පසු සමරු උත්සව හෝ කොඩි එසවීමෙන් හෝ පලක් නැත . මේ අයුරින් රටට අහිමි වූ ප්‍රථම සෙන්පතියා ඔහු නොවන්නා සේම අවසන් සෙන්පතියා ද නොවන්නේ ය. මෙවන් වටිනා දේශප්‍රේමීන් ආරක්ෂා නොකරන රජයක් රට ජාතික සතුරන්ගෙන් ගලවාගෙන ඉදිරියට ගෙන යනු ඇතැයි කේසේ විශ්වාස කරන්නද? රටක අහිංසක ජනතාව යුද්ධයෙන් හෝ ජාති වාදයෙන් හෝ වෙත් බේධ වලින් හෝ රවටා පාලකයන්ට සදා රජකම් කළ නොහැකිය. රැවටුණ ජනතාව සත්‍යය තේරුම් ගත් දිනෙක සියලුම බේධ අමතක කර සුදුසුම පුද්ගලයා සොයා ගන්නා බවට ඇමරිකානු ජනතාව අද දිනයේ පෙන්වා දී ඇත .

සෙන්පතිය ඔබ මියගොස් නොමැත . මිය ගොස් ඇත්තේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නීතිය හා සාමයයි. මිය ගිය ඔබට වඩා ජීවත් වන අප දහස් වාරයක් අසරණ ය.

ඔබට නිවන් සුව.

කොළොම්පුර සිට
විකුම් සත් ලියයි